සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

| | | |
|---|---|---|
| දේශපාලන විද්‍යාව I<br>அரசியல் விஞ்ஞானம் I<br>Political Science I | 23 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**විභාග අංකය:** .......................................

**උපදෙස්:**

- මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
- **A** කොටස බහුවරණ ප්‍රශ්න **30** කින් සහ **B** කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න **20** කින් යුක්ත වේ.
- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
- එක් ප්‍රශ්නයකට ලකුණු **දෙක** බැගින් මුළු ලකුණු **100** කි.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 1 - 3 | |
| 2 | 4 - 10 | |
| 3 | 11 - 17 | |
| 4 | 18 - 23 | |
| 5 | 24 - 30 | |
| 6 | 31 - 38 | |
| 7 | 39 - 48 | |
| 8 | 49 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## A කොටස

- අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරා, එහි **අංකය** වරහන් තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.

**1.** පහත සඳහන් දෑ අතුරින් දේශපාලනයේ අත්‍යවශ්‍ය ලක්ෂණයක් ලෙස සැලකෙන්නේ කුමක් ද?
(1) බලය
(2) සාමකාමී සහජීවනය
(3) ආචාරධර්ම
(4) ප්‍රචණ්ඩත්වය
(5) සහභාගිත්වය (......)

**2.** දේශපාලන විද්‍යාවේ සම්ප්‍රදායික මතය වඩාත් නිවැරදි ලෙසින් පිළිබිඹු වන්නේ පහත සඳහන් කවර ප්‍රකාශනයෙන් ද?
(1) රාජ්‍යය සහ ආණ්ඩුව පිළිබඳ අධ්‍යයනය
(2) මානව හිමිකම් පිළිබඳ අධ්‍යයනය
(3) රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ අධ්‍යයනය
(4) දේශපාලන චර්යාව පිළිබඳ අධ්‍යයනය
(5) ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ අධ්‍යයනය (......)

**3.** දේශපාලන විද්‍යාව අනෙකුත් විෂයයන්ගේ න්‍යායන්, සංකල්ප, සහ ක්‍රමවේද භාවිත කරනුයේ පහත සඳහන් කවර ප්‍රවේශයෙහි ද?
(1) දාර්ශනික ප්‍රවේශය
(2) බහු විෂයයික ප්‍රවේශය
(3) තුලනාත්මක ප්‍රවේශය
(4) දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය
(5) ස්ත්‍රීවාදී ප්‍රවේශය (......)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki

**4.** රාජ්‍යයේ අත්‍යවශ්‍ය අංගයක් ලෙසින් සැලකෙනුයේ පහත සඳහන් කවරක් ද?

(1) සමාජයීය ආයතන (2) ස්වාභාවික සම්පත්
(3) ආණ්ඩුව (4) තාක්ෂණය
(5) බලසම්පන්න හමුදාව (……)

**5.** රාජ්‍යය නිවැරදි ලෙසින් විස්තර කෙරෙනුයේ පහත සඳහන් කවර ප්‍රකාශයෙන් ද?

(1) රාජ්‍යයට ස්වාධිපත්‍යය නොමැතිව පැවතිය හැකි ය.
(2) රාජ්‍යය සමාජයීය ආයතනවලට යටත් ය.
(3) රාජ්‍යය දේශපාලන සංවිධානයකි.
(4) රාජ්‍යයට විධිමත් ආණ්ඩු ආයතන නොමැතිව පැවතිය හැකි ය.
(5) රාජ්‍යය සංස්කෘතික සහ ආගමික ආයතන ඇතුළත් කරගනී. (……)

**6.** පහත සඳහන් දේශපාලන මතවාද අතුරෙන් රාජ්‍යය ජාතිය මත පදනම් විය යුතුය යන්න වෙනුවෙන් පෙනී සිටින මතවාදය කුමක් ද?

(1) ලිබරල්වාදය (2) ජාතිකවාදය
(3) සමාජවාදය (4) නිරාගමිකවාදය
(5) සමූහාණ්ඩුවාදය (……)

**7.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ආණ්ඩුව වඩාත් හොඳින් විස්තර වන්නේ කුමකින් ද?

(1) රාජ්‍ය අධිකාරිය ක්‍රියාත්මක කිරීමට යොදා ගන්නා යාන්ත්‍රණයකි.
(2) සමස්ථ සමාජයම දේශපාලනිකව නියෝජනය කරන සංවිධානයකි.
(3) ස්ථිර ආයතනික ඒකකයකි.
(4) සෙසු සංවිධානවලට ඉහළින් සිටී.
(5) පෞද්ගලික සංවිධානවල එකතුවකි. (……)

**8.** ලිබරල්වාදය මූලික වශයෙන් අවධාරණය කරනුයේ

(1) මාධ්‍ය පිළිබඳ රාජ්‍යයේ පාලනය කෙරෙහි ය.
(2) රාජ්‍යය විසින් සමස්ථ ආර්ථික ක්‍රියාකාරකම් පාලනය කිරීම කෙරෙහි ය.
(3) අසහාය රාජාණ්ඩුවක් සහ පාරම්පරික පාලනයක් පවත්වාගෙන යාම කෙරෙහි ය.
(4) පුද්ගල නිදහස සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම කෙරෙහි ය.
(5) විධායකය තුළ බලතල සංකේන්ද්‍රණය කිරීම කෙරෙහි ය. (……)

**9.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අර්ධ-ජනාධිපති ආණ්ඩුක්‍රමය වඩාත් හොඳින් විස්තර කරනුයේ කවර ප්‍රකාශනයෙන් ද?

(1) විධායක බලය මුළුමනින් ම ජනාධිපති අත සංකේන්ද්‍රණය වී ඇත.
(2) විශ්වාසභංග යෝජනාවක් මගින් ජනාධිපති ඉවත් කළ හැකි ය.
(3) විධායකය මුළුමනින් ම ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීනව පවතී.
(4) ජනාධිපති ආණ්ඩුක්‍රමය සහ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය යන දෙකෙහි ම ඇතැම් ලක්ෂණ ඒකාබද්ධ කරගත් ආණ්ඩුක්‍රමයකි.
(5) අගමැතිවරයා රාජ්‍යයේ නායකයා ලෙසින් ක්‍රියාකරයි. (……)

**10.** පහත සඳහන් ඒවායින් සීමිත ආණ්ඩුවක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ කවරක් ද?

(1) ආණ්ඩු බලය කෙරෙහි ව්‍යවස්ථාමය සීමා පැවතීම
(2) නීතියේ ආධිපත්‍යය නොමැතිවීම
(3) ආණ්ඩුවේ සියලු බලතල තනි පාලකයෙකු අත සංකේන්ද්‍රණය වීම
(4) ආණ්ඩු බලතල කෙරෙහි සංවරණ හා තුලන ක්‍රමයක් නොමැතිවීම
(5) පුරවැසි අයිතිවාසිකම් සඳහා නීතියෙන් සහතික කරන ලද ආරක්ෂණ නොමැති වීම (……)

**11.** පහත සඳහන් සංකල්පවලට දෙන ලද විස්තර අතුරෙන් එකක් පමණක් නිවැරදි ය. නිවැරදි විස්තරය අයත් සංකල්පය තෝරන්න.

(1) ජාතික රාජ්‍යය - පොදු ජාතික අනන්‍යතාවක් බෙදාගන්නා පුරවැසියන්ගෙන් සමන්විත ස්වෛරී දේශපාලන සංගමයකි.
(2) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය - දේශපාලන සහභාගිත්වය අධෛර්යමත් කරන සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ආකෘතියකි.
(3) ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ඒකීය රාජ්‍යයේ අත්‍යවශ්‍ය අංග ලක්ෂණයකි.
(4) සහසන්ධීය ක්‍රමය - සියලු බලතල මධ්‍යම ආණ්ඩුව සතුවන පාලන ක්‍රමයකි.
(5) මානව හිමිකම් - රාජ්‍යය විසින් පුරවැසියන්ට පිරිනමනු ලබන අයිතිවාසිකම් ය. (......)

**12.** දෙන ලද රටවල ව්‍යවස්ථාමය ක්‍රමවලට අදාළ පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් එක් ප්‍රකාශයක් පමණක් නිවැරදිය. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) එක්සත් රාජධානියේ පාර්ලිමේන්තුව ස්වෛරී වන අතර ස්කොට්ලන්තයේ, වේල්සයේ, සහ උතුරු අයර්ලන්තයේ බලය පවරන ලද පරිපාලනය සීමිත බලතල ක්‍රියාත්මක කරයි.
(2) ස්විට්සර්ලන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ෆෙඩරල් ආණ්ඩුව සහ කැන්ටන්වල බලතල පැහැදිලි ලෙසින් අර්ථ නොදක්වයි.
(3) ඉන්දීය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මධ්‍යම ආණ්ඩුවට වඩා පුළුල් බලතල ප්‍රාන්ත ආණ්ඩුවලට ප්‍රදානය කරයි.
(4) ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රාන්ත ආණ්ඩුවල බලතල පමණක් ලැයිස්තුගත කරයි.
(5) ප්‍රංශ ආණ්ඩුක්‍රමය සලකනු ලබන්නේ අර්ධ සන්ධීය ක්‍රමයට සම්භාව්‍ය උදාහරණයක් වශයෙනි. (......)

**13.** ගැටුම් නිරාකරණය පොදුවේ තේරුම්ගනු ලබන්නේ,

(1) ඉක්මන් සහ සරල ක්‍රියාවලියක් ලෙසිනි.
(2) කෙටිකාලීන ක්‍රියාකාරකමක් ලෙසිනි.
(3) දිගුකාලීන ක්‍රියාවලියක් ලෙසිනි.
(4) රාජ්‍ය නොවන සංවිධාන පමණක් සිදු කරනු ලබන ක්‍රියාකාරකමක් ලෙසිනි.
(5) රාජ්‍යය පමණක් සම්බන්ධ වන ක්‍රියාකාරකමක් ලෙසිනි. (......)

**14.** ඒකීය රාජ්‍යයක් තුළ,

(1) ස්වාධිපත්‍ය මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු අතර බෙදා ගනී.
(2) ව්‍යවස්ථාදායකය මූලික වශයෙන් ම සමන්විත වන්නේ මණ්ඩල දෙකකිනි.
(3) බලතල බෙදීම අත්‍යවශ්‍ය ලක්ෂණයක් ලෙස පවතී.
(4) පළාත් පාලන ආයතනවලට බලතල ලැබෙන්නේ මධ්‍යම ආණ්ඩුවෙනි.
(5) මධ්‍යම ආණ්ඩුවට එහි අභිමතය පරිදි කිසිදු නීතියක් සම්පාදනය කළ නොහැකි ය. (......)

**15.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ස්වාධිපත්‍යයේ ලක්ෂණයක් විස්තර වන්නේ කවරකින් ද?

(1) රාජ්‍යයකට සෙසු රාජ්‍යයන්ගේ කටයුතුවලට මැදිහත්වීමට ඉඩ සලසයි.
(2) සියලු සමාජයීය ආයතන විසින් භුක්ති විඳිනු ලබයි.
(3) එය රාජ්‍යයට පමණක් හිමි බලයකි.
(4) ජනගහනයේ ප්‍රමාණය අනුව වෙනස් වේ.
(5) ආණ්ඩුවේ අත්‍යවශ්‍ය අංග ලක්ෂණයකි. (......)

PAST PAPERS WIKI

**16.** පහත සඳහන් චින්තකයන් අතුරෙන් රාජ්‍ය පිළිබඳ සමාජ සම්මුති න්‍යාය සමග සමීප සම්බන්ධතාවයක් ඇති චින්තකයා කවුරුන් ද?

(1) කාල් මාක්ස් (2) ඇඩම් ස්මිත්
(3) ජෝන් ලොක් (4) එඩ්මන්ඩ් බර්ක්
(5) ජේ. එස්. මිල් (......)

**17.** පහත සඳහන් ඒවායින් රාජ්‍යය ප්‍රතිපත්ති සම්පාදක ක්‍රියාවලිය තුළ දේශපාලන පක්ෂවල කාර්යභාරය පැහැදිලි වන්නේ කවර ප්‍රකාශයෙන් ද?

(1) ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට පමණක් සම්බන්ධ වීම.
(2) ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී නොසිටීම.
(3) ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී සෑම විට ම නිලධරතන්ත්‍රය සමග තරග කිරීම.
(4) ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයට පුරවැසියන්ගේ අභිලාෂ ගෙන ඒම.
(5) ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී සමාජයෙන් බැහැර කරන ලද පුද්ගලයන්ගේ අභිලාෂ නොසලකා හැරීම. (......)

[හතරවැනි පිටුව බලන්න.

Past Papers Wiki



18. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ව්‍යවස්ථානුකූලවාදය පිළිබඳ සංකල්පය පැහැදිලි කරන්නේ කුමකින් ද?
   (1) අධිකාරිවාදී පාලන ක්‍රම තුළ පුළුල් ලෙසින් ක්‍රියාත්මක වේ.
   (2) බලතල වෙන් කිරීමේ මූලධර්මය ප්‍රතික්ෂේප කරයි.
   (3) ව්‍යවස්ථාමය විධික්‍රම මගින් ආණ්ඩුවේ බලතල සීමා කිරීම වෙනුවෙන් පෙනී සිටී.
   (4) පුද්ගල නිදහස සීමා කරයි.
   (5) පාලකයන්ට ස්වකීය කැමැත්ත මත නීති පැනවීමේ හැකියාව ලබාදෙයි. (……)

19. පහත සඳහන් ඒවායින් අන්තර් ජාතික-රාජ්‍ය සංවිධානය (IGOs) තෝරන්න.
   (1) ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය
   (2) ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය
   (3) ලෝක වනජීවී අරමුදල
   (4) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
   (5) මානව හිමිකම් නිරීක්ෂණ සංවිධානය (……)

20. පහත සඳහන් ඒවා අතුරෙන් ජාත්‍යන්තර දේශපාලනයේ අරාජිකත්වයට සෘජුව දායක වන්නේ කුමක් ද?
   (1) රාජ්‍යයන් අතර සහයෝගිතාව
   (2) රාජ්‍යයන් අතර අන්තර් රැඳියාව
   (3) රාජ්‍යයන් අතර ගැටුම් සහ යුද්ධ
   (4) ජාත්‍යන්තර නීතිය සහ සදාචාරය
   (5) ජාත්‍යන්තර සංවිධාන (……)

- අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරා එහි **අංකය** වරහන් තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.

21. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ
   A - රට තුළ ඒකාබද්ධ ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කළේ ය.
   B - ආණ්ඩුවේ ඒකාධිපති ස්වභාවය ලිහිල් කළේ ය.
   C - ඉංග්‍රීසි භාෂාව පරිපාලන භාෂාව ලෙසින් යොදා ගත්තේ ය.
   D - රාජකාරි ක්‍රමය අහෝසි කළේ ය.
   E - ආණ්ඩුකාරයාගේ අත්තනෝමතික පාලනය ශක්තිමත් කළේ ය.

   (1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (……)

22. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අමාත්‍ය මණ්ඩලය
   A - පූර්ණ අර්ථයෙන් වෙස්ට්මින්ස්ටර් පන්නයේ කැබිනට් මණ්ඩලයක් නොවී ය.
   B - මහලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුක්ත විය.
   C - ආණ්ඩුකාරයා එහි සාමාජිකයෙකු ලෙස ඇතුළත් කරගත්තේ ය.
   D - අග්‍රාමාත්‍යවරයෙකු නොසිටි එකකි.
   E - සාමාජිකයන් දසදෙනෙකුගෙන් සමන්විත විය.

   (1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (……)

23. 1947/1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
   A - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදි මූලධර්ම මත පදනම් වූ ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කළේ ය.
   B - සුළුතර අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂ විධිවිධාන සැපයී ය.
   C - නියෝජන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය අඛණ්ඩව පවත්වාගෙන ගියේ ය.
   D - 1972 වසර වනතුරු බලපැවැත්වී ය.
   E - සෙනෙට් මණ්ඩලය නමින් හැඳින්වෙන සාපේක්ෂව බලවත් දෙවන මණ්ඩලයක් පිහිටුවී ය.

   (1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (……)

**24.** ශ්‍රී ලංකාවේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

A - ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුක්‍රමය අහෝසි කළේය.

B - සමූහාණ්ඩු ක්‍රමයක් පිහිටුවී ය.

C - වෙස්ට්මින්ස්ටර් ආණ්ඩුක්‍රමයේ ඇතැම් ලක්ෂණ රඳවාගත්තේ ය.

D - ශ්‍රී ලංකාව නිදහස් ස්වෛරී සහ ස්වාධීන රාජ්‍යයක් බවට පත් කළේය.

E - බලතල බෙදීමේ මූලධර්මය ශක්තිමත් කළේය.

(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (……)

**25.** 1978 වසරේ සිට ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමයේ අඛණ්ඩව පවතින ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ වනුයේ

A - මැතිවරණවල දී ඡන්දදායක සහභාගිත්වය ඉහළ මට්ටමක පැවතීම ය.

B - ජනාධිපති ධූරය රාජ්‍ය බලයේ කේන්ද්‍රීය ආයතනය ලෙස පැවතීම ය.

C - ව්‍යවස්ථාමය විධිවිධාන මගින් මූලික අයිතිවාසිකම් සහතික කිරීම ය.

D - සෑම විට ම නිසි කලට පැවැත්වෙන මැතිවරණ මගින් ආණ්ඩු වෙනස් කිරීම ය.

E - ක්‍රියාකාරී සිවිල් සමාජ සංවිධානවල පැවැත්ම ය.

(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (……)

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය ද'යි තෝරා, එහි **අංකය** වරහන් තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **26.** | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ජනාධිපති ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දුන්නේ ය. | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමයක් හඳුන්වා දුන්නේ ය. | (……) |
| **27.** | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයට අනුව, ජනාධිපතිවරයා පළාත් ආණ්ඩුකාරයින් පත්කරයි. | පළාත් ආණ්ඩුකාරයෝ ජනාධිපතිගේ ප්‍රසාදය ඇති තාක් ධූරය දරති. | (……) |
| **28.** | ශ්‍රී ලංකාවේ මැතිවරණවලට තරග කරන දේශපාලන පක්ෂ විශාල සංඛ්‍යාවක් ඇත. | සෑම දේශපාලන පක්ෂයකට ම දීප ව්‍යාප්තව සැලකිය යුතු මැතිවරණ සහයක් තිබේ. | (……) |
| **29.** | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනමත විචාරණය සැලකිය හැක්කේ සෘජු ප්‍රජාතන්ත්‍රවාදයේ වැදගත් මෙවලමක් ලෙස ය. | 1982 වසරෙන් පසු ශ්‍රී ලංකාව තුළ කිසිදු ජනමත විචාරණයක් පවත්වා නැත. | (……) |
| **30.** | ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව, අගමැති විදේශ කටයුතු අමාත්‍ය ධූරය දැරිය යුතු ය. | ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාර්ලිමේන්තුවේ කතානායක නොමැති සෑම අවස්ථාවක දී ම අගමැති කතානායක වශයෙන් කටයුතු කළ යුතු ය. | (……) |

## B කොටස

**31.** නූතන රාජ්‍යය සංවිධානය කර ඇත්තේ නිශ්චිත පදනම් මූලධර්ම කිහිපයක් මත ය. ඒවායින් ඕනෑම **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**32.** ස්වාධිපති බලය සංවිධානය කිරීම මත පදනම් වූ ආණ්ඩුක්‍රම ආකෘති අතුරෙන් ඕනෑම **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**33.** විධායක බලතල සංවිධානය කිරීම මත පදනම්වන ආණ්ඩුක්‍රම ආකෘතිවලින් ඕනෑම **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**34.** (1) එක් අධිකාරියක් හෝ ආයතනයක් තුළ බලතල සංකේන්ද්‍රණය වීම වළක්වන දේශපාලන සංකල්පය නම් කරන්න.

..........................................................................................................

(2) දේශපාලන ප්‍රජාවක් තුළ තීරණ ගැනීමට සහ ඒවා ක්‍රියාත්මක කිරීමට රාජ්‍යයට ඇති අවසාන බලය හැඳින්වෙන දේශපාලන සංකල්පය කුමක් ද?

..........................................................................................................

**35.** ‘සීමිත ආණ්ඩුව’ පිළිබඳ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය වර්ධනය කළ ප්‍රධාන දේශපාලන චින්තකයින් **දෙදෙනා** කවුරුන් ද?

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**36.** (1) ෆැසිස්ට් ඉතාලියේ නායකයා වූයේ කවුරුන් ද?

..........................................................................................................

(2) නාසි ජර්මනියේ නායකයා වූයේ කවුරුන් ද?

..........................................................................................................

**37.** ශ්‍රී ලංකාවේ 1978 ව්‍යවස්ථාවට සිදු කළ 13 වන සංශෝධනයට අදාළව මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා අතර බලතල බෙදා හැර තිබෙන්නේ ලැයිස්තු තුනක් යටතේ ය. ඒවායින් ඕනෑම **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**38.** (1) ආර්ථික සමානාත්මතාව වෙනුවෙන් පෙනී සිටින දේශපාලන මතවාදය කුමක් ද?

..........................................................................................................

(2) ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාව වෙනුවෙන් පෙනී සිටින දේශපාලන මතවාදය කුමක් ද?

..........................................................................................................

**39.** දේශපාලනය අධ්‍යයනය කිරීමේ සමාජ විද්‍යාත්මක ප්‍රවේශයට දායක වූ ප්‍රමුඛ න්‍යායවාදීන් **දෙදෙනෙකු** නම් කරන්න.

(1) ...........................................................................

(2) ...........................................................................

**40.** බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව මණ්ඩල දෙකකින් සමන්විත වේ. ඒවා නම් කරන්න.

(1) ...........................................................................

(2) ...........................................................................

**41.** දේශපාලන පක්ෂවල වර්ධනයට දායකවන සාධක **දෙකක්** නම් කරන්න.

(1) ...........................................................................

(2) ...........................................................................

**42.** රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවලියේ ඕනෑම පියවර **දෙකක්** නම් කරන්න.

(1) ...........................................................................

(2) ...........................................................................

**43.** ඇතැම් අන්තර් රාජ්‍ය සංවිධාන කලාපීය මට්ටමින් ක්‍රියාත්මක වේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ...........................................................................

(2) ...........................................................................

**44.** ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියට බලපෑම් කරනු ලබන අභ්‍යන්තර සාධක කිහිපයක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ...........................................................................

(2) ...........................................................................

**45.** (1) තිරසර සාමය පිළිබඳ සංකල්පය වර්ධනය කළ විද්වතා කවුරුන් ද?

...........................................................................

(2) ගැටුම් පරිවර්තනය පිළිබඳ සංකල්පය වර්ධනය කළ විද්වතා කවුරුන් ද?

...........................................................................

**46.** ඩොනමෝර් පාලන අවධිය තුළ (1931-1947) සුබසාධනය අරමුණු කරගත් ප්‍රතිපත්ති සහ ප්‍රතිසංස්කරණ කිහිපයක් හඳුන්වා දෙන ලදී. ඒවායින් ඕනෑම **දෙකක්** නම් කරන්න.

(1) ...........................................................................

(2) ...........................................................................

**47.** 1947-1948 සෝල්බරි ව්‍යවස්ථාව මගින් ස්ථාපිත කරන ලද ස්වාධීන කොමිෂන් සභා **දෙක** මොනවා ද?

(1) ...........................................................................

(2) ...........................................................................

**48.** ශ්‍රී ලංකාවේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලද ඕනෑම මූලික අයිතිවාසිකම් **දෙකක්** නම් කරන්න.

(1) ...........................................................................

(2) ...........................................................................

[අටවැනි පිටුව බලන්න.

**49.** (1) ශ්‍රී ලංකාවේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය බලයේ උත්තරීතර ආයතනය වූයේ කුමක් ද?

..............................................................................................................................

(2) ශ්‍රී ලංකාවේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය නායක ධුරය හැඳින්වූයේ කවර නමකින් ද?

..............................................................................................................................

**50.** (1) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය ඇති අධිකරණය කුමක් ද?

..............................................................................................................................

(2) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරණ පෙත්සම් විභාග කොට තීරණය කරන්නේ කුමන අධිකරණය විසින් ද?

..............................................................................................................................

❊ ❊ ❊

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

පැය තුනයි
*மூன்று மணித்தியாலம்*
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.

※ I කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, III කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමේ පහත සඳහන් ප්‍රවේශ කෙටියෙන් විස්තර කරන්න.
   (i) සමාජ විද්‍යාත්මක ප්‍රවේශය
   (ii) තුලනාත්මක ප්‍රවේශය (ලකුණු 10 × 2 = 20)

2. රාජ්‍යය සහ ආණ්ඩුව අතර ඇති වෙනස්කම් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 20)

3. පහත සඳහන් දේශපාලන මතවාදවලින් ඕනෑම **දෙකක** ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් සාකච්ඡා කරන්න.
   (i) ස්ත්‍රීවාදය
   (ii) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
   (iii) ෆැසිස්ට්වාදය (ලකුණු 10 × 2 = 20)

## II කොටස

4. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පහත සඳහන් ඕනෑම **දෙකක** බලතල සහ කාර්යයන් කෙටියෙන් සාකච්ඡා කරන්න.
   (i) ආණ්ඩුකාරවරයා
   (ii) රාජ්‍ය නිලධාරීන්
   (iii) රාජ්‍ය මන්ත්‍රණ සභාව
   (iv) අමාත්‍ය මණ්ඩලය (ලකුණු 10 × 2 = 20)

5. (i) 1947/1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සුළුතර කණ්ඩායම්වල ආරක්ෂාව සඳහා තිබුණු ව්‍යවස්ථාමය රැකවරණ **පහක්** සඳහන් කරන්න. (ලකුණු 05)
   (ii) 1947/1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සුළුතර කණ්ඩායම්වල ආරක්ෂාව සඳහා සපයා තිබුණු ව්‍යවස්ථාමය රැකවරණවල සාර්ථකත්වය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 15)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki
PAST PAPERS WIKI
අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**6.** ශ්‍රී ලංකාවේ 1972 ප්‍රථම සමූහාණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 20)

**7.** (i) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ සංයුතිය, බලතල සහ කාර්යයන් විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුව අතර ඇති සම්බන්ධතාවය සාකච්ඡා කරන්න.

(ලකුණු $10 \times 2 = 20$)

## III කොටස

**8.** පහත සඳහන් ඕනෑම **දෙකක්** කෙටියෙන් සාකච්ඡා කරන්න.

(i) ප්‍රංශ ආණ්ඩුක්‍රමයේ ඒකීය ලක්ෂණ
(ii) ඉන්දියානු සන්ධීය ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ
(iii) ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රාන්ත ආණ්ඩුවල බලතල

(ලකුණු $10 \times 2 = 20$)

**9.** නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමට බලපෑ ඕනෑම සාධක **හතරක්** විස්තර කරන්න. (ලකුණු 20)

**10.** පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම **දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකළ 19 වන සංශෝධනය
(ii) නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන ලක්ෂණ
(iii) ජාත්‍යන්තර දේශපාලනය තුළ රාජ්‍ය නොවන ක්‍රියාධරයින්
(iv) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය තුළ විපක්ෂයේ කාර්යභාරය
(v) ගැටුම් පිළිබඳ සරල වර්ගීකරණය

(ලකුණු $10 \times 2 = 20$)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library